**දෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතිය - සංරචකය - I - 2017**

**-----------------------------------------------------------------------**

දෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතියේ - සංරචකය - I 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තාව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2013 අගෝස්තු 19 දින එළඹි අංක 5228 - එල්කේ දරන මූල්‍ය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

**------------------------------------------------------------------------------------------**

මූල්‍ය ගිවිසුම අනුව, එවකට සෞඛ්‍ය අමාත්‍යාංශය වර්තමානයේ, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් ජාතික මට්ටමින් ව්‍යාපෘතියේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කෙරෙන අතර පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් පළාත් මට්ටමින් ව්‍යාපෘති කාර්යයන් සිදුකිරීම අපේක්ෂා කෙරේ. ව්‍යාපෘති ශක්‍යතා ලියවිල්ල අනුව, 2013 සිට 2017 වර්ෂය දක්වා ජාතික සෞඛ්‍ය සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීමට මූල්‍ය සහාය සැපයීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. මන්ද පෝෂණය හා බෝ නොවන රෝග පිළිබඳ අභියෝග සඳහා යහපත් ප්‍රතිචාර දැක්වීමට හැකිවන පරිදි මහජන සෞඛ්‍ය පිළිබඳ කාර්යසාධන ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 25,270 කට සමාන විගැහි මිලියන 129.8 ක් (එජඩො මිලියන 200 ක්) වන අතර ඉන් රු.මිලියන 24,006 කට සමාන විගැහි මිලියන 123.31 ක් (එජඩො මිලියන 190 ක්) ව්‍යාපෘතියේ සංරචක - I යටතේ සිදුකළ යුතු කාර්යයන් සඳහා වෙන්කර තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 ජුලි 01 දින ආරම්භ කරන ලද අතර 2018 සැප්තැම්බර් 30 වන විට නිම කිරීමට නියමිතය. සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් පළාත් මට්ටමින් සිදු කරන ලද කාර්යයන් පිළිබඳ හා වෙනම ඉදිරිපත් කරන ලද ව්‍යාපෘතියේ සංරචක - I සඳහා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම් මෙම වාර්තාවේ අඩංගු වේ.

**1.3 මූල්‍ය වාර්තාව සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**-------------------------------------------------------------------**

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම්වල සම්පාදනයක් වන මෙම මූල්‍ය වාර්තාව පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය වාර්තාව පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය වාර්තාව ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය වාර්තාවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය වාර්තාවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාව පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල

සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය වාර්තාවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් දරන ලද වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ සෞඛ්‍ය අංශයේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) මුදල් රෙගුලාසි 150 හා 2017 ඔක්තෝබර් 16 දිනැති රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අංක 258/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට අනුකූලව මූල්‍ය වාර්තාව පිළියෙල කර තිබුණේද යන බව.

(උ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඌ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 මතය**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම් පදනම් වූ 2017 වර්ෂය සඳහා මූල්‍ය වාර්තාව මුදල් රෙගුලාසි 150 හා 2017 ඔක්තෝබර් 16 දිනැති අංක 258/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කර ඇත. ඉහත විසර්ජන ගිණුම් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන්, වාර්ෂික අයවැය ඇස්තමේන්තු, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් පවත්වා තිබුණු පොත්පත් ලේඛන හා වාර්තා සමඟ එකඟ වී තිබුණි.

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඈ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

2014 මැයි 21 දිනැති අංක ඩීඑම්එස්/සී/1/16/ව්‍යා. දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපියේ නියෝග ප්‍රකාරව ව්‍යාපෘති අධ්‍යක්ෂ හා ගණකාධිකාරී වැනි තනතුරු ඇතුළත් ප්‍රධාන කාර්ය මණ්ඩල තනතුරු සඳහා පූර්ණ කාලීන පදනම මත නිලධාරීන් බඳවා ගැනීම සිදු කළ යුතු වුවද එයට පටහැනිව ව්‍යාපෘතිය විසින් රේඛීය අමාත්‍යාංශයට අනුයුක්තව සිටි ව්‍යාපෘති අධ්‍යක්ෂවරයකු හා ගණකාධිකාරීවරයකු ඇතුළත් ව්‍යාපෘතියේ ප්‍රධාන තනතුරු වැඩ බැලීමේ පදනම මත යොදවා තිබුණි. මෙම කරුණ මාගේ පෙර වර්ෂවල වාර්තාවලින්ද පෙන්වා දී තිබුණද, එය නිවැරදි කිරීම සඳහා කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2017 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ජාසංස සංරචකය - I | 190 | 24,006 | 3,106 | 7.56 | 1,160.03 | 23.61 | 3,619.40 |
| | 190 | 24,006 | 3,106 | 7.56 | 1,160.03 | 23.61 | 3,619.40 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති ශක්‍යතා ලියවිල්ල අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ණය නියෝජිතායතනය විසින් රු.මිලියන 6,707.55 කට සමාන එජඩො මිලියන 43.75 ක් වියපැහැදම් කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ රේඛීය අමාත්‍යාංශය සඳහා රු.මිලියන 3,636 ක ප්‍රතිපාදන හා පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ සඳහා රු.මිලියන 3,260 ක ප්‍රතිපාදන පමණක් වෙන්කර තිබුණි. ඉහත වෙන් කිරීමෙන් සියයට 68.95 ක් නියෝජනය වන රු.මිලියන 4,751.46 ක මුදලක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කර තිබුණි.

(ආ) ඉහත තොරතුරු අනුව, ව්‍යාපෘතිය යටතේ කරන ලද රු.මිලියන 24,006 කට සමාන එජඩො මිලියන 190 ක මුළු වෙන්කිරීමෙන් සියයට 15.08 ක් නියෝජනය වන රු.මිලියන 3,619.40 කට සමාන එජඩො මිලියන 23.61 ක මුදලක් පමණක් 2017 දෙසැම්බර් 31 දිනට රේඛීය අමාත්‍යාංශය විසින් උපයෝජනය කර තිබුණි. එබැවින්, ව්‍යාපෘතියේ ඉතිරි වර්ෂ 01 ක කාලපරිච්ඡේදය තුළ සමස්ත වෙන්කිරීම උපයෝජනය කිරීමේ හැකියාව සැකසහිත වේ.

## 3.2 භෞතික ප්‍රගතිය

------------------

ව්‍යාපෘතිය යටතේ ඉටුකර ගැනීම සඳහා අපේක්ෂිත භෞතික ඉලක්ක වියපැහැදම් දර්ශක 03 ක් හා වියපැහැදම් නොවන දර්ශක 11 ක් මත පදනම් වේ. ලැබුණු තොරතුරු අනුව, වියපැහැදම් දර්ශක 03 ක හා වියපැහැදම් නොවන දර්ශක 07 ක අපේක්ෂිත ප්‍රතිඵල 2017 දෙසැම්බර් 31 දිනට ඉටුකරගෙන තිබුණි. වියපැහැදම් දර්ශක හා වියපැහැදම් නොවන දර්ශක යටතේ දක්වා ඇති ඉලක්ක ඉටුකර ගැනීම පිළිබඳ නිරීක්ෂණයන් පහත දැක්වේ.

(අ) වියපැහැදම් දර්ශක - 01 යටතේ ශ්‍රී ලංකාවේ රෝහල්වල හදිසි ප්‍රතිකාර සේවා වැඩිදියුණු කිරීම සඳහා ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, රෝහල් 14 ක නව හදිසි ප්‍රතිකාර ඒකක ඉදිකිරීමට හා දිවයින පුරා වෙනත් රෝහල් 14 ක පවත්නා හදිසි ප්‍රතිකාර ඒකකවල පහසුකම් වැඩිදියුණු කිරීමට අපේක්ෂා කර තිබුණි. විගණන විමර්ශන අනුව, පවත්නා හදිසි ප්‍රතිකාර ඒකක වැඩිදියුණු කිරීම පිළිබඳ කොන්ත්‍රාත් 12 ක් පමණක් 2017 දෙසැම්බර් 31 දිනට නිමකර තිබුණි. එවැනි නව හදිසි ප්‍රතිකාර ඒකක 14 කින් ඒකක 04 ක් ඉදිකිරීම සඳහා රු.මිලියන 1,192 ක පිරිවැයකට 2015 වර්ෂයේදී කොන්ත්‍රාත්තු පිරිනමා තිබුණු අතර එම වැඩ ආරම්භ කළ දින සිට වර්ෂ 03 ක් ගතවීමෙන් පසුවත් කිසිඳු ඉදිකිරීමක් සම්පූර්ණ කර නොතිබුණි. පොලොන්නරුව මහ රෝහලෙහි ඉදිකිරීම් වැඩ 2017 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ කර නොතිබුණද, ව්‍යාපෘතියේ වියපැහැදම් දර්ශක ඉටුකර ගැනීම් පිළිබඳ වාර්තාවල සම්පූර්ණ කරන ලද වැඩ ලෙස දක්වා තිබුණි.

(ආ) ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, ක්ෂය රෝග රෝගීන් හඳුනාගැනීමේ අනුපාතය වැඩිකර ගැනීම, සාමාන්‍ය මහජනතාව සඳහා අධ්‍යාපනය ලබාදීම, සාමාන්‍ය මහජනතාව අතර සංකල්පිත වෙනසක් ඇතිකිරීම සහ ඒ සඳහා නවීන සොයාගැනීම් තාක්ෂණයන් භාවිතා කිරීමේ අරමුණින් වියපැහැදම් නොවන දර්ශක - 09 යටතේ ක්ෂය රෝග රෝගීන් හඳුනාගැනීම සඳහා දිවයින පුරා පුද්ගලයන් 13,861 ක් පරීක්ෂා කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළ පුද්ගලයින් 10,811 ක් පමණක් හඳුනාගෙන තිබුණි. විගණනයට අනුව බලන කල, රෝගය හඳුනාගැනීම පිළිබඳ රෝගීන්ගේ දැනුවත්භාවය මත නව ක්ෂය රෝග රෝගීන් හඳුනාගැනීම සහ ඒ සඳහා අඛණ්ඩ ප්‍රතිකාර ලබාගැනීම ප්‍රධාන වශයෙන් රඳා පවතින නමුත් එය ප්‍රමාණවත් පරිදි ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඇ) වියපැහැදම් නොවන දර්ශක - 10 යටතේ 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතට අනුව, පරිසර ආරක්ෂණ බලපත්‍ර හා අපද්‍රව්‍ය කළමනාකරණ සැලසුම් බලපත්‍රය ලබාගැනීමට හැකිවන පරිදි 'ඒ' ශ්‍රේණියේ මූලික රෝහල්වල කාර්යසාධනය මැනීමට ව්‍යාපෘතිය විසින් කටයුතු කර තිබුණි. ලැබුණු තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළදී වියපැහැදම් නොවන දර්ශක - 10 යටතේ සපුරා ගත යුතු සියයට 30 ක අපේක්ෂිත ඉලක්කයෙන් සියයට 17.4 ක් පමණක් නියෝජනය වන 'ඒ' ශ්‍රේණියේ මූලික රෝහල් 69 කින් රෝහල් 12 ක් පමණක් බලපත්‍ර ලබාගැනීම සඳහා සුදුසුකම් ලබා තිබුණි.

(ඈ) වියපැහැදම් නොවන දර්ශක - 11 අනුව, සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩ හා සේවා 665 ක් ප්‍රසම්පාදනය කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ ප්‍රසම්පාදන අංශය සැලසුම් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ පළමු මාස 09 තුළ එවැනි විෂයයන් සියයට 80 කට වැඩි ප්‍රමාණයක් ප්‍රසම්පාදනය කිරීම සඳහා කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමට අවශ්‍ය වී තිබුණි. කෙසේ වුවද, විෂයයන් 470 ක් ප්‍රසම්පාදනය කිරීම සඳහා කොන්ත්‍රාත්තු පමණක් වර්ෂයේ පළමු මාස 09 තුළ ප්‍රදානය කර තිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

**---------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබුණු තොරතුරු අනුව, රේඛීය ත්වරක (Linear Accelerators) 14 ක්, සීටී සිමියුලේටර්ස් 08 ක්, බැචිතෙරපි යන්ත්‍ර 08 ක් යනාදී පිළිකා ප්‍රතිකාර උපකරණ රු.මිලියන 6,853.46 කට සමාන එජඩො මිලියන 53.38 ක පිරිවැයකට සපයා සවිකිරීම සඳහා විදේශීය සැපයුම්කරුවන් 02 දෙනෙකු විසින් 2010 සැප්තැම්බර් මාසයේදී කරන ලද ස්වේච්ඡා (unsolicited) යෝජනා එහි ඇතුළත් පිළිගත නොහැකි මූල්‍යමය කරුණු හේතුවෙන් ප්‍රතික්ෂේප කර තිබුණි. කෙසේ වුවද, ජාත්‍යන්තරව නව ලංසු කැඳවීමකින් තොරව එම මිල ගණන්වලට එම සැපයුම්කරුටම අදාළ කොන්ත්‍රාත්තුව 2015 වර්ෂයේදී ප්‍රදානය කර තිබුණි. තවද, 2015 දෙසැම්බර් 02 දින සපයා තිබූ රු.මිලියන 476 ක් වටිනා රේඛීය ත්වරක 02 ක් එම යන්ත්‍ර සවිකිරීම සඳහා කොන්ක්‍රීට් බංකර් 2018 මැයි 31 වන විටත් ඉදිකර නොතිබූ බැවින් යාපනය හා මඩකලපුව ශික්ෂණ රෝහල්වල පැවතුණි.

(ආ) 2015 වර්ෂයේදී හඳුන්වා දෙන ලද අනතුරු හා හදිසි ආපදා ආරක්ෂණ සේවා සඳහා ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ අරමුණින් කළුතර, පොලොන්නරුව, යාපනය මහ රෝහල්වල හා කල්මුනෙයි මූලික රෝහලේ හදිසි ප්‍රතිකාර ඒකක සඳහා නව ගොඩනැගිලි ඉදිකිරීමට ව්‍යාපෘතිය විසින් රු.මිලියන 484.2 ක මුදලක් වෙන්කර තිබුණි. කළුතර මහ රෝහලේ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව පිළිබඳ පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව හදිසි පදනම මත නිමකර ගැනීමේ අරමුණින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමෙන් තොරව වහාම ඉදිකිරීම් නිමකර ලබාගැනීමේ (turnkey) පදනම මත රු.මිලියන 922 ක ඇස්තමේන්තුගත පිරිවැයකට රාජ්‍ය සංස්ථාවකට අදියර 02 ක් යටතේ ප්‍රදානය කර තිබුණි. කෙසේ වුවද, අදියර - 01 ඉදිකිරීම් වැඩ 2017 දෙසැම්බර් 31 දිනට නිමකිරීමට සැලසුම් කර තිබූ දිනයේ සිට මාස 10 ක් ඉකුත්වීමෙන් පසුව ද නිමකර නොතිබුණි. තවද, කොන්ත්‍රාත්කරු සමඟ එළඹි කිසිඳු ලිඛිත ගිවිසුමක් නොතිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධානවලට පටහැනිව හා කිසිඳු ලිඛිත ගිවිසුමකට එළඹීමෙන් තොරව ඉදිකිරීම් වැඩ සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කරන ලද එම රාජ්‍ය සංස්ථාවෙන්ම උපදේශක සේවාවන්ද ලබාගෙන තිබුණි. තවද, ඉදිකිරීම් වැඩ සඳහා මුදාහරින ලද වැඩපූර්ව අත්තිකාරමෙන් උපදේශක සේවා සඳහා කරන ලද රු.මිලියන 11.14 ක ගෙවීම අයකර ගැනීමටද කටයුතු කර නොතිබුණි.

(ii) අදියර - 01 යටතේ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.මිලියන 328.75 ක් වූ ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 38.71 කින් වැඩිකර තිබුණද, ඒ සඳහා අවශ්‍ය අනුමැතිය පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවද, 2017 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 19.47 ක් වූ අදියර - 01 යටතේ ඉදිකිරීම් වැඩ පිළිබඳ විචලන නියෝග සඳහා ඉල්ලීම් රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබාගැනීමෙන් තොරව නිරවුල් කර තිබුණි. ඉදිකිරීම් වැඩ 2018 මැයි 15 දින දක්වා කාලය දීර්ඝ කිරීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.14.1 ඡේදය පරිදි රේඛීය අමාත්‍යාංශයේ ලේකම්ගෙන් අවශ්‍ය අනුමැතියද ලබාගෙන නොතිබුණි.

(iv) කොන්ත්‍රාත්තුවේ අදියර 01 යටතේ රු.මිලියන 2.09 ක් වූ සහතික කරන ලද වැඩවලට අදාළ ගෙවීම් කොන්ත්‍රාත්තුවේ අදියර - 02 යටතේ සහතික කරන ලද වැඩ ලෙස ගිණුම්ගත කර තිබුණු බව නිරීක්ෂණය විය.

### 3.4 මූල්‍ය පාලන පිළිබඳ ගැටලු

------------------------------

මුදල් රෙගුලාසි 133(2) හා 2010 ජුනි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය අනුව ව්‍යාපෘතියේ කාර්යයන් පිළිබඳ විගණන සැලැස්මක් රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය විසින් පිළියෙල කර ක්‍රියාත්මක කළ යුතුය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂය සඳහා එවැනි අභ්‍යන්තර විගණන සැලැස්මක් වෙනම පිළියෙල කර ක්‍රියාත්මක කර තිබූ බවට කිසිඳු සාක්ෂියක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව ව්‍යාපෘතිය සඳහා අභ්‍යන්තර විගණකවරයකු 2017 අගෝස්තු 14 දින බඳවා ගෙන තිබුණද, 2017 දෙසැම්බර් 01 දින ඔහු සේවයෙන් ඉවත්වීම දක්වා කරන ලද අභ්‍යන්තර විගණන කාර්යයන් පිළිබඳ කිසිඳු සාක්ෂියක් ලැබී නොතිබුණි.

### 3.5 මතභේදයට තුඩුදෙන කරුණු

----------------------------------

රේඛීය අමාත්‍යාංශයේ වාහන සංචිතය කළමනාකරණය කිරීම සඳහා රු.මිලියන 4.70 ක පිරිවැයකට පරිගණක පදනම් මෘදුකාංග පද්ධතියක් ප්‍රසම්පාදනය කිරීම සඳහා පුද්ගලික සමාගමක් සමඟ ගිවිසුමකට එළඹීමට ව්‍යාපෘතිය විසින් කටයුතු කර තිබුණි. විගණනයේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) මුදල් රෙගුලාසි 135 හා 2016 ජනවාරි 06 දිනැති සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ සෞඛ්‍ය/ සීඒ/01/2016 දරන චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව රේඛීය අමාත්‍යාංශයේ ප්‍රවාහන අංශයේ අධ්‍යක්ෂ විසින් අදාළ ගිවිසුම අත්සන් කර තිබුණි.

(ආ) මෙම කාර්යයන් 2014 දෙසැම්බර් 18 දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා 2016 පෙබරවාරි 29 දින ගිවිසුම අත්සන් කර තිබූ අතර 2016 ජුනි 30 දිනට නිම කිරීම සඳහා සැලසුම් කර තිබුණි. මෘදුකාංගය ස්ථාපිත කිරීමේ කටයුතු 2017 දෙසැම්බර් 31 දක්වා නිම කර නොතිබූ අතර ගිවිසුමේ කාලපරිච්ඡේදය දීර්ඝ කිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දින වන විටත් පියවර ගෙන නොතිබුණි.

(ඇ) කාර්යසාධන ඇපකරයක් ලබාගැනීමෙන් තොරව සැපයුම්කරුට රු.මිලියන 1.88 ක මුදලක් මුදාහැර තිබුණි.